# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1859/30 - 2014 අප්‍රේල් මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2014.04.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

1980 අංක 02 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනතේ, 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, ජනාධිපති හා රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන විෂයභාර අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති ඉඩම, නාගරික සංවර්ධන විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත මෙහි පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ඉඩම් කොටස ඓතිහාසික බෞද්ධ උරුමයක් ලෙස ආරක්ෂා කිරීම වහාම අවශ්‍ය වී ඇති බව මාගේ මතය වන හෙයින්, එකී ඉඩම් කොටස එකී කාර්යය සඳහා අවශ්‍ය බව මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2014 අප්‍රේල් මස 17 වැනි දින,
කොළඹ,
ජනාධිපති කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පිටකොටුව, කොළඹ මහ නගර සභා සීමාව තුළ පිහිටි ස්ථිර බලයලත් මිනින්දෝරු පී. එෆ්. ගුණසේකර මහතා විසින් 1934.09.18 දින මැන පිළියෙල කරන ලද අංක 1030 දරන මිනින්දෝරු සැලැස්මේ ඇතුලත් පර්චස් 20.10 (දළ වශයෙන්) ඉඩම් කොටස සඳහා මායිම් පහත දැක්වේ :

| | | |
|---|---|---|
| *උතුරට* | : | වරිපනම් අංක 138 ; |
| *නැගෙනහිරට* | : | වරිපනම් අංක 207 නොරිස් පාර ; |
| *දකුණට* | : | නොරිස් පාර ; |
| *බටහිරට* | : | වරිපනම් අංක 195 හා 197 නොරිස් පාර. |

05 - 221

1A - G 019439 — 65 (2014/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*